# 4 ශ්‍රේණිය සිංහල 2022

# ගුරු අත් පොතට වැඩ පොත අංක 07

## L4, S4, R4 W4 නිපුණතා ආවරණය




- උපදෙස් කියවා ඒ අනුව ප්‍රතිචාර දක්වයි.
- ප්‍රවෘත්තිවලට සවන් දී එක් සිදුවීමක් ප්‍රකාශ කරයි.
- නිවේදනයකට සවන් දී එහි වැදගත් කරුණු ඉදිරිපත් කරයි.
- ප්‍රවෘත්ති සහ නිවේදන ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කර ගනියි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_4$ $S_4$ $R_4$ $W_4$ ඉගෙනුම් පල

- උපදෙස් කියවා ඒ අනුව ප්‍රතිචාර දක්වයි.
- ප්‍රවෘත්තිවලට සවන් දී එක් සිදුවීමක් ප්‍රකාශ කරයි.
- නිවේදනයකට සවන් දී එහි වැදගත් කරුණු ඉදිරිපත් කරයි.
- ප්‍රවෘත්ති සහ නිවේදන ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කර ගනියි.

**උපදෙස්.**

- වරහන් තුළ ඇති වචනවලින් නිවැරදි වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

1. ශ්‍රී ලංකාව ..................................... සාගරයේ පිහිටි කුඩා දිවයිනකි. (ඉන්දියන්, ශාන්තිකර)
2. අම්මා එනතුරු .............................................. (මම / අපි) බලා සිටියෙමි.
3. අපි තෙල් මල් රැගෙන පන්සල් .............................................. (ගියෝය / ගියෙමු)
4. (ළමුන් / ළමයි) .............................................. සෙල්ලම් කිරීමට පිටියට ගියහ.)
5. කිකිළිය පසුපස පැටව් දුවගෙන .............................................. (යයි / යති)

- පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුරු ඡේදයෙන් තෝරා, දී ඇති තිත් ඉරි මත ලියන්න.

කැලයේ අප සිත් ගත් එක තැනක් වූයේ දිය ඇල්ල යි. කන්ද මැද්දේ රත්තණ පඳුරක් අස්සෙන් මතුවන පුංචි දිය කඳුරක් වේගයෙන් පහළට ගලා බසියි. වතුර ගලන්නේත් පහත් තැනකට යයි පෙන්වන ලෙසින් තවත් දිය කඳුරු කීපයක් ඊට ම එක්වෙයි. එහෙයින් ටික දුරක් යන්නට පෙර සෑහෙන දිය කඳක් ගලා බසියි. මේ දිය කඳ එක් තැනක දී ගල් තලාවකින් පහළට ඇද හැලී අපූරු දිය ඇල්ලක් මවයි. ලොකු කුඩා ගල් පර්වත රැසක හැපෙන දිය කඳ සුදු පැහැයෙන් රෑරා ගොස් ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි. මේ ඇළ නැවත මතුවන්නේ ගම මැදින් ගලා බසිමිනි.

දිය ඇල්ලේ සෝෂාව කැලෑවේ ටික දුරක් පැතිරෙයි. ගල් තලා දෙපස ඕකිඩ්, වෙසක් ආදි මල් ද, කුඩා හැඩයා, ලොකු හැඩයා ආදි පැළෑටි ද වැවී ඇත. කිසිවකු අතින් සාත්තු නො ලබන මල් පඳුරු විස්තර කළ නො හැකි අලංකාර මල් හට ගන්වයි. . . .

ගඟ අද්දර කැලේ,
සෝමවීර සේනානායක

1. කැලයේ සිත් ගත් තැන වූයේ කුමන ස්ථානය ද ?

.......................................................................................................................................

2. රත් තණ පඳුරක් අස්සෙන් මතු වූයේ කුමක් ද ?

.......................................................................................................................................

3. ගල් තලාවකින් ඇද හැලෙන දිය කඳ හඳුන්වන්නේ කුමන නමකින් ද ?

.......................................................................................................................................

4. ගල් පර්වත රැසක හැපෙන දිය කඳ කුමන පැහැයෙන් යුතු ද ?

.......................................................................................................................................

5. ගල්තලා දෙපස වැවී ඇත්තේ මොනවා ද ?

.......................................................................................................................................

.......................................................................................................................................

- ඡේදය කියවා පහත සඳහන් පක්‍රාශ හරි නම් √ ලකුණ ද, වැරදි නම් X ලකුණ ද යොදන්න.
  1. කැලයේ සිත් ගත් තැන වූයේ ඊතණ පඳුර යි. ( )
  2. රත්තණ පඳුර අස්සෙන් මතු වූයේ පුංචි දිය කඳුරකි. ( )
  3. දිය කඳුර හෙමින් පහළට ගලා බසියි. ( )
  4. දිය කඳ සැදෙන්නේ දිය කඳුරු එක් වීමෙනි. ( )
  5. දිය කඳ ගල්තලාවකින් පහළට ඇද හැලේ. ( )

- නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.
  1. දිය ඇල්ල තිබුණේ ........................................ (ගමේ ය./කැලයේ ය.)
  2. රත්තණ පඳුර අස්සෙන් මතු වූයේ ........................................ (දිය කඳුරකි./දිය ඇල්ලකි.)
  3. දිය කඳුරු කිහිපයක් එක් වී සැදෙන්නේ ........................................ (දිය ඇල්ලකි./දිය කඳුරකි.)
  4. ගම මැදින් මතු වන්නේ ........................................ (දිය ඇල්ලකි./ඇලකි.)
  5. කැලෑවේ ටික දුරක් යන තෙක් පැතිරෙන්නේ ........................................ (ඇලෙහි ඝෝෂාව යි./ දිය ඇල්ලේ ඝෝෂාව යි.)

- පහත සඳහන් වාක්‍ය නිවැරදි අනුපිළිවෙළට ගළපා නැවත ලියන්න.
  - දිය කඳ අපූරු දිය ඇල්ලක් මවයි.
  - ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි.
  - රත්තණ පඳුරක් අස්සෙන් දිය කඳුරක් ගලා බසියි.
  - ටික දුරක් යන විට දිය කඳක් ගලා බසියි.
  - දිය කඳ ලොකු කුඩා පර්වත රැසක හැපෙයි.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

- ඡේදයෙන් විස්තර කෙරෙන දේවල් 4ක් ලියන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

## <u>ප්‍රවෘත්ති</u>

- පහත සඳහන් ප්‍රවෘත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන ශෛලියෙන් කියවන්න.

ආයුබෝවන්.
මේ කලණ ළමා රූපවාහිනී සේවය යි.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ඉදිරිපත් කිරීම . . . . . . . . .
මුලින් ම සිරස්තල

- ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය සැමරීම පෙබරවාරි මස 21 වන දින සිදු කරයි.
- සුරක්ෂිත ව පෙළපොත් පරිහරණය කළ යුතු බව ගරු අධ්‍යාපන ඇමතිතුමා පවසයි.
- ශ්‍රී ලාංකේය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සුරක්ෂා රක්ෂණාවරණය හඳුන්වා දෙයි.

- 2000 වර්ෂයේ සිට සෑම වර්ෂයක ම පෙබරවාරි මස 21 වන දින ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය ලෙස සැමරීම සිදු කරනු ලැබේ. මේ වන විට ලෝකයේ රටවල් 188ක් ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය සමරයි. ලොව වැඩි ම පිරිසක් භාවිත කරන භාෂාව, චීන භාෂාව වන අතර දෙවන ස්ථානය හිමි වන්නේ ස්පාඤ්ඤ භාෂාවට යි. ඉංග්‍රීසි භාෂාවට තෙවන ස්ථානය හිමි වන අතර සිංහල භාෂාවට 62 වන ස්ථානය හිමි වෙයි.

- නිදහස් අධ්‍යාපනය මඟින් ශ්‍රී ලංකාවේ පාසල්වල සිසුන්ට නොමිලයේ පෙළපොත් ලබා දීම වාර්ෂික ව සිදු කරනු ලබයි. ඇතැම් සිසුන් මෙම පෙළපොත් ක්‍රමවත් ලෙස පාවිච්චි නොකරන බව පෙනී ගොස් ඇත. සිසුන්, ක්‍රමවත් ලෙස පෙළපොත් පාවිච්චි කළහොත් වෙනත් සිසුන්ට ද එම පොත් පාවිච්චියට ගත හැකි ය. මේ නිසා පෙළපොත් සුරක්ෂිත ව පරිහරණය කිරීම සිසුන් සතු වගකීමක් බව ගරු අධ්‍යාපන ඇමතිතුමා අවධාරණය කරයි.

- අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2017 ඔක්තෝබර් මාසයේ ශ්‍රී ලාංකේය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සුරක්ෂා රක්ෂණාවරණය හඳුන්වා දෙන ලදි. මිලියන 4.5කට ආසන්න රජයේ, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වල දරු දැරියන් මෙන් ම පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින් ද මෙම රක්ෂණාවරණයට හිමිකම් ලබති. පාසල තුළ දී හා ඉන් පිටත දී සිසුන් මුහුණ දෙන ලෙඩ රෝග, අනතුරු හා ආබාධ සඳහා ආරක්ෂාව ලබා දීම සුරක්ෂා රක්ෂණාවරණයේ අරමුණ යි.

ප්‍රවෘත්ති සමාප්ත යි.

- නිවසේ දී ඇසූ රූපවාහිනියේ හෝ ගුවන් විදුලියේ විකාශය වුණු ප්‍රවෘත්තියක් ලියන්න.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

# නිවේදන

- පහත සඳහන් නිවේදන කියවා පිළිතුරු ලියන්න.

හතර වන ශ්‍රේණිය සඳහා වාර්ෂික ව පැවැත්වෙන වෛද්‍ය සායනය මැයි මස 23 වන බදාදා පෙරවරු 9ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. මේ සඳහා මහජන සෞඛ්‍ය නිලධාරී කාර්යාලයයේ වෛද්‍යවරුන් සහ කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකු ද පැමිණීමට නියමිත ය. ඔබේ එන්නත් කාඩ්පත සහ වෙනත් රෝග විනිශ්චය කාඩ්පතක් තිබේ නම් එය ද රැගෙන ආ යුතු ය. ඔබේ ඇස් සහ දත් පරීක්ෂා කර ඔබට විටමින් සහ පණු බෙහෙත් ද ලබා දෙනු ඇත. දෙමව්පියන්ගේ පැමිණීම අනිවාර්ය වන අතර, පෙ.ව.8.30 වන විට ඔවුන් ප්‍රධාන ශාලාවට පැමිණ අසුන් ගත යුතු ය.

1. හතර වන ශ්‍රේණිය සඳහා පැවැත්වෙන වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කවරදා ද ?

.......................................................................................................................................

2. වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කොහේ ද ?

.......................................................................................................................................

3. එදින ඔබ පාසලට රැගෙන ආ යුතු දේවල් මොනවා ද ?

.......................................................................................................................................

4. දෙමව්පියන් පාසලට පැමිණිය යුත්තේ කුමන වේලාවට ද ?

.......................................................................................................................................

5. වෛද්‍ය සායනයේ දී සිදු කරන්නේ කුමක් ද ?

.......................................................................................................................................

.......................................................................................................................................

අප පාසලේ ඩෙංගු මර්දන දිනය යෙදී ඇත්තේ මැයි මස 5 වන දිනට ය. දෙමව්පියන්ගේ සහභාගිත්වයෙන් ඩෙංගු මර්දන වැඩ සටහනක් පාසල තුළ ක්‍රියාත්මක කෙරේ. එදින උදේ 8.30 වන විට දෙමව්පියන් පාසලට පැමිණිය යුතු ය. එසේ පැමිණෙන විට උදැල්ලක්/විසි කැත්තක්/පිහියක් වැනි උපකරණයක් රැගෙන ආ යුතු ය. එදින පැමිණෙන සියලු දෙනාට සංග්‍රහ කටයුතු සිදු කරනු ලබන්නේ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසිනි. මේ සඳහා පැමිණීම අනිවාර්ය බව ඔබගේ දෙමව්පියන්ට දැනුම් දෙන්න..

1. ඩෙංගු මර්දන දිනය යෙදී ඇත්තේ කවදාට ද ?

.......................................................................................................................................

2. ඩෙංගු මර්දන වැඩ සටහන පැවැත්වෙන්නේ කොහේ ද ?

.......................................................................................................................................

3. එය පැවැත්වෙන්නේ කීයට ද ?

.......................................................................................................................................

4. එදිනට සංග්‍රහ කටයුතු සිදු කරන්නේ කවු ද ?

.......................................................................................................................................

5. එදිනට දෙමාපියන් රැගෙන ආ යුතු දේවල් මොනවා ද ?

.......................................................................................................................................

වාර්ෂික ව පවත්වනු ලබන පාසල් පොළ මෙවර ද, නොවැම්බර් මස 28 වන සිකුරාදා පෙ.ව. 9.00ට පාසල් භූමිය තුළ පැවැත්වීමට නියමිත ය. ඒ සඳහා සැම සිසුවකු ම තම ගෙවත්තේ වගා කර ඇති එළවළු, පලතුරු රැගෙන උදේ 7.30 වන විට පාසලට පැමිණිය යුතු බව දැනුම් දෙන්න. පොළ සකස් කිරීමට සහ බඩු මිල දී ගැනීමට පැමිණෙන ලෙස ඔබ දෙමව්පියන් දැනුම්වත් කරන්න.

1. පාසල් පොළ පැවැත්වෙන්නේ කවදාට ද ?

..........................................................................................................................................

2. එය පැවැත්වෙන්නේ කීයට ද ?

..........................................................................................................................................

3. සිසුන් පාසලට පැමිණිය යුත්තේ කීයට ද ?

..........................................................................................................................................

4. සිසුන් විසින් එදිනට රැගෙන ආ යුත්තේ මොනවා ද ?

..........................................................................................................................................

5. මෙම නිවේදනය සකස් කර ඇත්තේ කුමක් සඳහා ද ?

..........................................................................................................................................

..........................................................................................................................................

අප පාසලේ අලුතින් ඉදි කරන ලද පරිගණකාගාර ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය මැයි මස 10 වන බ්‍රහස්පතින්දා පෙරවරු 10.00ට පැවැත්වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා සහභාගි වෙයි. එදින සියලු සිසුන් ආරාධිත අමුත්තා පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව දක්වා දෙපස පෙළගැසී සිටිය යුතු ය. දෙමව්පියන් අනිවාර්යයෙන් උත්සවයට සහභාගි විය යුතු ය. ඔවුන් පෙරවරු 9.30 වන විට ප්‍රධාන ශාලාවේ අසුන් ගත යුතු බව සංවිධායක මණ්ඩලය දැනුම් දෙයි.

1. ඉහත නිවේදනය සකස් කර ඇත්තේ කුමක් සඳහා ද ?

..........................................................................................................................................

2. විවෘත කිරීමේ උත්සවය පැවැත්වෙන්නේ කවදා ද ?

..........................................................................................................................................

3. එය පැවැත්වෙන්නේ කීයට ද ?

..........................................................................................................................................

4. එදිනට පැමිණෙන ප්‍රධාන ආරාධිත අමුත්තා කවු ද ?

..........................................................................................................................................

5. උත්සව දිනයේ සිසුන් කළ යුත්තේ කුමක් ?

..........................................................................................................................................

..........................................................................................................................................

6. දෙමාපියන් පැමිණිය යුත්තේ කීයට ද ?

..........................................................................................................................................

7. පහත සඳහන් හිස් තැන්වලට සුදුසු වචන ලියන්න.

- ✓ පරිගණකාගාර ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය පවත්වන්නේ .................. මස ............... වන ....................................... ය.
- ✓ ප්‍රධාන ආරාධිත අමුත්තා ........................................................................................ ය.
- ✓ සිසුන් ........................................................................ පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව දක්වා දෙපස පෙළගැසී සිටිය යුතු ය.
- ✓ දෙමවුපියන් ....................................................................................................... අසුන් ගත යුතු ය.

# පිළිතුරු




**Answer**

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_4$ $S_4$ $R_4$ $W_4$ ඉගෙනුම් පල

- උපදෙස් කියවා ඒ අනුව ප්‍රතිචාර දක්වයි.
- ප්‍රවෘත්තිවලට සවන් දී එක් සිදුවීමක් ප්‍රකාශ කරයි.
- නිවේදනයකට සවන් දී එහි වැදගත් කරුණු ඉදිරිපත් කරයි.
- ප්‍රවෘත්ති සහ නිවේදන ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කර ගනියි.

## උපදෙස්.

- වරහන් තුළ ඇති වචනවලින් නිවැරදි වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

1. ශ්‍රී ලංකාව ..........ඉන්දියන්.......... සාගරයේ පිහිටි කුඩා දිවයිනකි. (ඉන්දියන්, ශාන්තිකර)
2. අම්මා එනතුරු ..........මම.......... (මම / අපි) බලා සිටියෙමි.
3. අපි තෙල් මල් රැගෙන පන්සල් ..........ගියෙමු.......... (ගියෝය / ගියෙමු)
4. (ළමුන් / ළමයි) ..........ගියහ.......... සෙල්ලම් කිරීමට පිටියට ගියහ.)
5. කිකිළිය පසුපස පැටවි දුවගෙන ..........යති.......... (යයි / යති)

- පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුරු ඡේදයෙන් තෝරා, දී ඇති තිත් ඉරි මත ලියන්න.

කැලයේ අප සිත් ගත් එක තැනක් වූයේ දිය ඇල්ල යි. කන්ද මැද්දේ රත්තණ පඳුරක් අස්සෙන් මතුවන පුංචි දිය කඳුරක් වේගයෙන් පහළට ගලා බසියි. වතුර ගලන්නේත් පහත් තැනකට යයි පෙන්වන ලෙසින් තවත් දිය කඳුරු කීපයක් ඊට ම එක්වෙයි. එහෙයින් ටික දුරක් යන්නට පෙර සෑහෙන දිය කඳක් ගලා බසියි. මේ දිය කඳ එක් තැනක දී ගල් තලාවකින් පහළට ඇද හැලී අපූරු දිය ඇල්ලක් මවයි. ලොකු කුඩා ගල් පර්වත රැසක හැපෙන දිය කඳ සුදු පැහැයෙන් රෑරා ගොස් ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි. මේ ඇළ නැවත මතුවන්නේ ගම මැදින් ගලා බසිමිනි.

දිය ඇල්ලේ සෝභාව කැලෑවේ ටික දුරක් පැතිරෙයි. ගල් තලා දෙපස ඕකිඩ්, වෙසක් ආදි මල් ද, කුඩා හැඩයා, ලොකු හැඩයා ආදි පැළෑටි ද වැවී ඇත. කිසිවකු අතින් සාත්තු නො ලබන මල් පඳුරු විස්තර කළ නො හැකි අලංකාර මල් හට ගන්වයි. . . .

ගඟ අද්දර කැලේ,
සෝමවීර සේනානායක

1. කැලයේ සිත් ගත් තැන වූයේ කුමන ස්ථානය ද ?
..........දිය ඇල්ල..........
2. රත් තණ පඳුරක් අස්සෙන් මතු වූයේ කුමක් ද ?
..........පුංචි දිය කඳුරක්..........
3. ගල් තලාවකින් ඇද හැලෙන දිය කඳ හඳුන්වන්නේ කුමන නමකින් ද ?
..........දිය ඇල්ල..........
4. ගල් පර්වත රැසක හැපෙන දිය කඳ කුමන පැහැයෙන් යුතු ද ?
..........සුදු පැහැයෙන්..........
5. ගල්තලා දෙපස වැවී ඇත්තේ මොනවා ද ?
..........ඕකිඩ්, වෙසක් ආදි මල් ද, කුඩා හැඩයා, ලොකු හැඩයා ආදි..........
..........පැළෑටි ද වැවී ඇත..........

- ඡේදය කියවා පහත සඳහන් ප්‍රකාශ හරි නම් √ ලකුණ ද, වැරදි නම් X ලකුණ ද යොදන්න.

1. කැලයේ සිත් ගත් තැන වූයේ ඊතණ පඳුර යි. ( X )
2. රත්තණ පඳුර අස්සෙන් මතු වූයේ පුංචි දිය කඳුරකි. ( √ )
3. දිය කඳුර හෙමින් පහළට ගලා බසියි. ( X )
4. දිය කඳ සෑදෙන්නේ දිය කඳුරු එක් වීමෙනි. ( √ )
5. දිය කඳ ගල්තලාවකින් පහළට ඇද හැලේ. ( √ )

- නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

1. දිය ඇල්ල තිබුණේ ........................................ (ගමේ ය./කැලයේ ය.)
2. රත්තණ පඳුර අස්සෙන් මතු වූයේ ........................................ (දිය කඳුරකි./දිය ඇල්ලකි.)
3. දිය කඳුරු කිහිපයක් එක් වී සෑදෙන්නේ ........................................ (දිය ඇල්ලකි./දිය කඳුරකි.)
4. ගම මැදින් මතු වන්නේ ........................................ (දිය ඇල්ලකි./ඇලකි.)
5. කැලෑවේ ටික දුරක් යන තෙක් පැතිරෙන්නේ ........................................ (ඇලෙහි ඝෝෂාව යි./ දිය ඇල්ලේ ඝෝෂාව යි.)

- පහත සඳහන් වාක්‍ය නිවැරදි අනුපිළිවෙළට ගළපා නැවත ලියන්න.
  - දිය කඳ අපූරු දිය ඇල්ලක් මවයි.
  - ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි.
  - රත්තණ පඳුරක් අස්සෙන් දිය කඳුරක් ගලා බසියි.
  - ටික දුරක් යන විට දිය කඳක් ගලා බසියි.
  - දිය කඳ ලොකු කුඩා පර්වත රැසක හැපෙයි.

රත්තණ පඳුරක් අස්සෙන් දිය කඳුරක් ගලා බසියි.
ටික දුරක් යන විට දිය කඳක් ගලා බසියි.
දිය කඳ අපූරු දිය ඇල්ලක් මවයි.
දිය කඳ ලොකු කුඩා පර්වත රැසක හැපෙයි.
ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි.

- ඡේදයෙන් විස්තර කෙරෙන දේවල් 4ක් ලියන්න.

දිය ඇල්ලේ ආරම්භය හා අවසානය ගැන
දිය ඇල්ලේ ඝෝෂාව ගැන
කැලයේ ගල් තලා දෙපස වැවී ඇති පැළෑටි ගැන
කැලයේ ඇති අලංකාර මල් පඳුරු ගැන

## ප්‍රවෘත්ති

- පහත සඳහන් ප්‍රවෘත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන ශෛලියෙන් කියවන්න.

ආයුබෝවන්.
මේ කලණ ළමා රූපවාහිනී සේවය යි.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ඉදිරිපත් කිරීම . . . . . . . . .
මුලින් ම සිරස්තල

- ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය සැමරීම පෙබරවාරි මස 21 වන දින සිදු කරයි.
- සුරක්ෂිත ව පෙළපොත් පරිහරණය කළ යුතු බව ගරු අධ්‍යාපන ඇමතිතුමා පවසයි.
- ශ්‍රී ලාංකේය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සුරක්ෂා රක්ෂණාවරණය හඳුන්වා දෙයි.

- 2000 වර්ෂයේ සිට සැම වර්ෂයක ම පෙබරවාරි මස 21 වන දින ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය ලෙස සැමරීම සිදු කරනු ලැබේ. මේ වන විට ලෝකයේ රටවල් 188ක් ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය සමරයි. ලොව වැඩි ම පිරිසක් භාවිත කරන භාෂාව, චීන භාෂාව වන අතර දෙවන ස්ථානය හිමි වන්නේ ස්පාඤ්ඤ භාෂාවට යි. ඉංග්‍රීසි භාෂාවට තෙවන ස්ථානය හිමි වන අතර සිංහල භාෂාවට 62 වන ස්ථානය හිමි වෙයි.

- නිදහස් අධ්‍යාපනය මඟින් ශ්‍රී ලංකාවේ පාසල්වල සිසුන්ට නොමිලයේ පෙළපොත් ලබා දීම වාර්ෂික ව සිදු කරනු ලබයි. ඇතැම් සිසුන් මෙම පෙළපොත් ක්‍රමවත් ලෙස පාවිච්චි නොකරන බව පෙනී ගොස් ඇත. සිසුන්, ක්‍රමවත් ලෙස පෙළපොත් පාවිච්චි කළහොත් වෙනත් සිසුන්ට ද එම පොත් පාවිච්චියට ගත හැකි ය. මේ නිසා පෙළපොත් සුරක්ෂිත ව පරිහරණය කිරීම සිසුන් සතු වගකීමක් බව ගරු අධ්‍යාපන ඇමතිතුමා අවධාරණය කරයි.

- අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2017 ඔක්තෝබර් මාසයේ ශ්‍රී ලාංකේය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සුරක්ෂා රක්ෂණාවරණය හඳුන්වා දෙන ලදි. මිලියන 4.5කට ආසන්න රජයේ, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වල දරු දැරියන් මෙන් ම පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින් ද මෙම රක්ෂණාවරණයට හිමිකම් ලබති. පාසල තුළ දී හා ඉන් පිටත දී සිසුන් මුහුණ දෙන ලෙඩ රෝග, අනතුරු හා ආබාධ සඳහා ආරක්ෂාව ලබා දීම සුරක්ෂා රක්ෂණාවරණයේ අරමුණ යි.

ප්‍රවෘත්ති සමාප්ත යි.

- නිවසේ දී ඇසූ රූපවාහිනියේ හෝ ගුවන් විදුලියේ විකාශය වුණු ප්‍රවෘත්තියක් ලියන්න.

ආයුබෝවන්.
මේ ජාතික රූපවාහිනී ළමා පුවත් අංශය යි.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ඉදිරිපත් කිරීම විහිනි දෙව්ජා,
මුලින් ම සිරස්තල

- 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාරය 50% කින් වැඩි කෙරේ.
- නාවික හමුදාව වෙරළ තීරය පිරිසිදු කිරීමට එක්වෙයි.

- පහ ශ්‍රේණිය ශිෂ්‍යාධාරය මේ වසරේ සිට 50% කින් වැඩි කිරීමට රජය විසින් තීරණය කර ඇති අතර ඒ අනුව ඉදිරි වසරේ සිට සිසුවෙකුට ශිෂ්‍යාධාර ලෙස මසකට රුපියල් 750ක මුදලක් ලැබෙනු ඇත.

- ජාතික වෙරළ සංරක්ෂණ පනතට වසර 10ක් පිරීම නිමිත්තෙන් දිවයින වටා ම පිහිටි වෙරළ තීරය පිරිසිදු කිරීමට නාවික හමුදාව එක්වෙයි. මෙම වැඩසටහන පුරා සතියක් පැවැත්වෙන බව නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කර සිටියේ ය.

ප්‍රවෘත්ති සමාප්ත යි.

## නිවේදන

- පහත සඳහන් නිවේදන කියවා පිළිතුරු ලියන්න.

හතර වන ශ්‍රේණිය සඳහා වාර්ෂික ව පැවැත්වෙන වෛද්‍ය සායනය මැයි මස 23 වන බදාදා පෙරවරු 9ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. මේ සඳහා මහජන සෞඛ්‍ය නිලධාරී කාර්යාලයයේ වෛද්‍යවරුන් සහ කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකු ද පැමිණීමට නියමිත ය. ඔබේ එන්නත් කාඩ්පත සහ වෙනත් රෝග විනිශ්චය කාඩ්පතක් තිබේ නම් එය ද රැගෙන ආ යුතු ය. ඔබේ ඇස් සහ දත් පරීක්ෂා කර ඔබට විටමින් සහ පණු බෙහෙත් ද ලබා දෙනු ඇත. දෙමව්පියන්ගේ පැමිණීම අනිවාර්ය වන අතර, පෙ.ව.8.30 වන විට ඔවුන් ප්‍රධාන ශාලාවට පැමිණ අසුන් ගත යුතු ය.

1. හතර වන ශ්‍රේණිය සඳහා පැවැත්වෙන වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කවරදා ද ?
   මැයි මස 23 වන බදාදා
2. වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කොහේ ද ?
   විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී
3. එදින ඔබ පාසලට රැගෙන ආ යුතු දේවල් මොනවා ද ?
   එන්නත් කාඩ්පත සහ වෙනත් රෝග විනිශ්චය කාඩ්පතක් තිබේ නම් එය
4. දෙමව්පියන් පාසලට පැමිණිය යුත්තේ කුමන වේලාවට ද ?
   පෙ.ව.8.30 වන විට
5. වෛද්‍ය සායනයේ දී සිදු කරන්නේ කුමක් ද ?
   ඇස් සහ දත් පරීක්ෂා කර ඔබට විටමින් සහ පණු බෙහෙත් ද ලබා දෙනු ඇත.

අප පාසලේ ඩෙංගු මර්දන දිනය යෙදී ඇත්තේ මැයි මස 5 වන දිනට ය. දෙමව්පියන්ගේ සහභාගිත්වයෙන් ඩෙංගු මර්දන වැඩ සටහනක් පාසල තුළ ක්‍රියාත්මක කෙරේ. එදින උදේ 8.30 වන විට දෙමව්පියන් පාසලට පැමිණිය යුතු ය. එසේ පැමිණෙන විට උදැල්ලක්/විසි කැත්තක්/පිහියක් වැනි උපකරණයක් රැගෙන ආ යුතු ය. එදින පැමිණෙන සියලු දෙනාට සංග්‍රහ කටයුතු සිදු කරනු ලබන්නේ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසිනි. මේ සඳහා පැමිණීම අනිවාර්ය බව ඔබගේ දෙමව්පියන්ට දැනුම් දෙන්න..

1. ඩෙංගු මර්දන දිනය යෙදී ඇත්තේ කවදාට ද ?
   මැයි මස 5 වන දිනට
2. ඩෙංගු මර්දන වැඩ සටහන පැවැත්වෙන්නේ කොහේ ද ?
   පාසල තුළ
3. එය පැවැත්වෙන්නේ කීයට ද ?
   එදින උදේ 8.30ට
4. එදිනට සංග්‍රහ කටයුතු සිදු කරන්නේ කවු ද ?
   විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසිනි
5. එදිනට දෙමාපියන් රැගෙන ආ යුතු දේවල් මොනවා ද ?
   උදැල්ලක්/විසි කැත්තක්/පිහියක් වැනි උපකරණයක්

වාර්ෂික ව පවත්වනු ලබන පාසල් පොළ මෙවර ද, නොවැම්බර් මස 28 වන සිකුරාදා පෙ.ව. 9.00ට පාසල් භූමිය තුළ පැවැත්වීමට නියමිත ය. ඒ සඳහා සෑම සිසුවකු ම තම ගෙවත්තේ වගා කර ඇති එළවළු, පලතුරු රැගෙන උදේ 7.30 වන විට පාසලට පැමිණිය යුතු බව දැනුම් දෙන්න. පොළ සකස් කිරීමට සහ බඩු මිල දී ගැනීමට පැමිණෙන ලෙස ඔබ දෙමව්පියන් දැනුම්වත් කරන්න.

1. පාසල් පොළ පැවැත්වෙන්නේ කවදාට ද ?

නොවැම්බර් මස 28 වන සිකුරාදා

2. එය පැවැත්වෙන්නේ කීයට ද ?

පෙ.ව. 9.00ට

3. සිසුන් පාසලට පැමිණිය යුත්තේ කීයට ද ?

උදේ 7.30 වන විට

4. සිසුන් විසින් එදිනට රැගෙන ආ යුත්තේ මොනවා ද ?

තම ගෙවත්තේ වගා කර ඇති එළවළු, පලතුරු

5. මෙම නිවේදනය සකස් කර ඇත්තේ කුමක් සඳහා ද ?

වාර්ෂික ව පවත්වනු ලබන පාසල් පොළ සකස් කිරීමට සහ බඩු මිල දී ගැනීමට පැමිණෙන ලෙස දැනුම්වත් කිරීමට

අප පාසලේ අලුතින් ඉදි කරන ලද පරිගණකාගාර ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය මැයි මස 10 වන බ්‍රහස්පතින්දා පෙරවරු 10.00ට පැවැත්වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා සහභාගි වෙයි. එදින සියලු සිසුන් ආරාධිත අමුත්තා පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව දක්වා දෙපස පෙළගැසී සිටිය යුතු ය. දෙමව්පියන් අනිවාර්යයෙන් උත්සවයට සහභාගි විය යුතු ය. ඔවුන් පෙරවරු 9.30 වන විට ප්‍රධාන ශාලාවේ අසුන් ගත යුතු බව සංවිධායක මණ්ඩලය දැනුම් දෙයි.

1. ඉහත නිවේදනය සකස් කර ඇත්තේ කුමක් සඳහා ද ?

පරිගණකාගාර ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය දැන්වීමට

2. විවෘත කිරීමේ උත්සවය පැවැත්වෙන්නේ කවදා ද ?

මැයි මස 10 වන බ්‍රහස්පතින්දා

3. එය පැවැත්වෙන්නේ කීයට ද ?

පෙරවරු 10.00ට

4. එදිනට පැමිණෙන ප්‍රධාන ආරාධිත අමුත්තා කවු ද ?

ගරු අධ්‍යාපන ඇමතිතුමා

5. උත්සව දිනයේ සිසුන් කළ යුත්තේ කුමක් ?

ආරාධිත අමුත්තා පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව දක්වා දෙපස පෙළගැසී සිටිය යුතු ය.

6. දෙමාපියන් පැමිණිය යුත්තේ කීයට ද ?

පෙරවරු 9.30 වන විට

7. පහත සඳහන් හිස් තැන්වලට සුදුසු වචන ලියන්න.

- ✓ පරිගණකාගාර ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය පවත්වන්නේ ......මැයි...... මස ......10..... වන ......බ්‍රහස්පතින්දා.... ය.
- ✓ ප්‍රධාන ආරාධිත අමුත්තා ..........ගරු අධ්‍යාපන ඇමතිතුමා......... ය.
- ✓ සිසුන් ..........ආරාධිත අමුත්තා.......... පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව දක්වා දෙපස පෙළගැසී සිටිය යුතු ය.
- ✓ දෙමවුපියන් ........(පෙරවරු 9.30 වන විට) ප්‍රධාන ශාලාවේ.......... අසුන් ගත යුතු ය.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

**අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.**

**ස්තුතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.**

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

**එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ**